# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2053/7 - 2018 ජනවාරි මස 08 වැනි සඳුදා - 2018.01.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

අංක 32 සහ 33 වගන්ති යටතේ නියෝග

ක්‍රීඩා අමාත්‍ය දයාසිරි ජයසේකර වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ අංක 32 (ආ) සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව හොකී ක්‍රීඩාව සඳහා ජාතික සම්මේලනය වන ශ්‍රී ලංකා හොකී සම්මේලනයේ ලියාපදිංචිය වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන අතර, තාවකාලික කාර්ය ක්‍රමයක් වශයෙන් එකී ශ්‍රී ලංකා හොකී සම්මේලනයේ කටයුතු තවදුරටත් පවත්වාගෙන යාම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වන සාමසුන්දර ඒකනායක රාජවර්ධන තෙන්නකෝන් මුදියන්සේලාගේ සමන් ප්‍රියන්ත බණ්ඩාර මහතා 2018.01.04 වන දින සිට නිසි බලධරයා වශයෙන් පත් කරන අතර, ශ්‍රී ලංකා හොකී සම්මේලනයේ 2018 වර්ෂය සඳහා නව නිලධාරී මණ්ඩලය පත් කර ගැනීම පිණිස නිලවරණය කැඳවීමට හා පැවැත්වීමට මෙයින් නියම කරමි.

නීතිඥ දයාසිරි ජයසේකර (පා.ම.),
ක්‍රීඩා අමාත්‍ය.

2018 ජනවාරි මස 04 වැනි දින,
කොළඹ දී ය.

01 - 613